www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉන්ධන මිල දැවැන්ත ලෙස ඉහල යාමට සමාජවාදී පිලිතුරක්

## A socialist response to the massive rise in fuel prices

**සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රකාශනයක්**
**2006 අප්‍රේල් 26**

ඉන්ධන මිල දැවැන්ත ලෙස ඉහල නැගීමෙන් එක්සත් ජනපදයේ කම්කරු පවුල්වලට ඉමහත් විනාශයක් අත් කර දෙමින් පවතිනුයේ, සෞඛ්‍ය රක්ෂනයේ පටන්, නිවාස හා ආහාර මිලෙහි ඉහල යෑම මගින් ඔවුන්ගේ වැටුප් චෙක්පත් කාබාසිනියා කර ඇති තත්වයක ය. පසු ගිය දෙසතිය තුල පමනක් ඉන්ධන පිරවුම් හල්වල මිල ගනන් ආසන්න වසයෙන් ශත 25 කින් - ගැලුමකට ඩොලර් 2.91 ක සාමාන්‍යයකින් ඉහල නැගි අතර කැලිෆෝනියා, නිව් යෝර්ක් හා අනෙකුත් නගරවල මිල, ඩොලර් 3.10 ඉක්මවා ඇත.

මෑතක දී මත විමසුමට ලක් කල එක්සත් ජනපදයේ වැඩිහිටියන්ගෙන් සියයට 70ක් කියා සිටියේ, පසු ගිය වසරේ පටන් සියයට 31න් ඉහල නැගි තෙල් මිල තමන්ට ඉමහත් මූල්‍ය දුෂ්කරතා ඇති කර තිබෙන බවයි. නොවෙනස් ආදායම් ලබන වයස්ගතවූවන් සේම, ගම්බද වැසියන් ද කුඩා ව්‍යාපාරිකයන් ද විනාශයට මුහුන දී සිටින අතර දශලක්ෂ සංඛ්‍යාත ඇමරිකානුවන්ට රැකියා සඳහා බොහෝ දුර ධාවනය කිරීමට බල කෙරී ඇත. අර්බුදය, ට්‍රක් රථ හා ගුවන් යානා කර්මාන්තයෙහි ද ආර්ථිකය පුරාම ද මහා පරිමාන දොට්ටදැමීම් කරා ගමන් කල හැකි ය.

මෙම අර්බුදය යටින් පවතින්නේ, නිෂ්පාදන බලවේගයන්හි වර්ධනයත්, ධනේශ්වර ලාභ පද්ධතියේ සමාජ සම්බන්ධතාවනුත් අතර අති මූලික පරස්පර විරෝධය යි. එහි නග්නතම ප්‍රකාශනය අත් කර ගත්තේ සෑම දිනක් ම මිනිස් අවශ්‍යතාවන්ටත් ජීවිතයට මත් වඩ වඩාත් නොගැලපෙන්නාවූ, පෙට්රෝලියම් මත පදනම් වූ ආර්ථිකයක පැවතීමෙනි.

ඇමරිකානුවන් "දැඩි ග්‍රීෂ්මයකට" පත් කරනු ඇති බවට අනතුරු අඟවමින් හා ඉදිරි මාස කීපයේ දී ගැලුමකට ඩොලර් 4 ඉක්මවා යාහැකි මිල ගනන් කෙරෙහි බලපාන්නේ යයි සැලකෙන "සීමිත සැපයුමට" දොස් පවරමින්, ජනාධිපති බුෂ්, නැගී එන කෝපයට පිලිතුරු ලෙස බොහෝ දුරට නිෂ්ඵල පියවර මාලාවක් ප්‍රකාශයට පත් කලේ ය. අඟහරුවාදා ප්‍රකාශිත, ඉන්ධන පිරිපහදුකරුවන් පාලනය කරන පාරිසරික නීති අත්හිටුවීමේ ද, ආන්ඩුවේ හදිසි ඉන්ධන සංචිත සඳහා මිලට ගැනීම් නතරකිරීමේ ද, මෙම සංචිතවලින් බොර තෙල් ලබා ගත් තෙල් සමාගම්වලට, පැරනි නය ගෙවීමට කල් ලබා දීමේ මෙම යෝජනා, බල ශක්ති සංගතයන්ගේ ලාභ ඉපැයීම් තව දුරටත් පෝෂනය කරන අතර, මිල පහල දැමීමට කිසිසේත් බල නොපානු හෝ අල්ප වසයෙන් බලපානු ඇත.

මේ අතර, මිල පහත හෙලීමේ "රිදී උන්ඩයක්" නැති බව පැවසූ සෙනේට් බහුතරයේ ප්‍රධානී බිල්ෆ්‍රිස්ට්, ඇමරිකානුවන් හොඳ සැතපුම් ගනනක් ලබා ගැනීමට තම මෝටර් රථ කාර්යක්ෂම කර, වඩා සෙමින් පැදවිය යුතුය යි අවවාදයක්ද කලේ ය. රැකියාවන් සඳහා යාමට දිගු දුරක් ගෙවීමේ වියදම් මගින් තම සැබෑ වේතන කැපී යාම අත්විඳින කම්කරුවන්ට නම්, ෆ්‍රිස්ට්ගේ ප්‍රකාශ "තොපි කේක් කාපල්ලා" යයි කීමට සමාන ය.

වොෂින්ටනයේ තෙල් සමාගම් හා ඔවුන්ගේ ක්ෂමාලාපකයන්, මිලවැඩිවීම් සඳහා ලෝක බොරතෙල් මිලගනන්වලට හා පාරිසරික නීතිරෙගුලාසිවලට දොස් පවරන අතර සැබෑ හේතුව වන්නේ අනපේක්ෂිතව කඩා වැදුනු වාසනාව භුක්තිවිඳිමින්, තෙල් සමාගම් විසින් උපයන ලාභය යි. සැපයුම මත ද, නිෂ්පාදන මට්ටම් සංචාලනයේ දී ද, සිය ග්‍රහනය දැඩිකර ගැනීමට ඉඩ සලසමින්. පසු ගිය දශකය පුරා තෙල් කර්මාන්තයෙහි ඒකාබද්ධවීම් හා සහබද්ධයන් මාලාවක් ම ඇතිව තිබේ. වත්මන් අර්බුදය, වෙලඳපොලේ නීති සමුදායක් කිසියම් ස්වාභාවික ආකාරයකින් ක්‍රියාත්මකවීමේ ප්‍රතිඵලය නොව මෙම කාරනය පිලිබඳව ඉමහත් පුද්ගලික අවශ්‍යතාවත් සහිත ව්‍යාපාර ලොක්කන් විසින් ගනු ලබන නිශ්චිත තීරනවල ප්‍රතිඵලයකි.

1990 ගනන්වල දී, තෙල් පිරිපහදුවේ අනවශ්‍ය තරම් විශාල පරිමාව හා තෙල් "අධි සැපයුම" මගින් ලාභ සීමාවන් පහත හෙලීම පිලිබඳව, තෙල් නිෂ්පාදකයන් මැසිවිලි නැගුවේ සුලුපටු ලෙස නොවේ. 1995 පටන් එක්සත් ජනපදය තුල, දිනකට තෙල් පිරිපහදුව බැරල් 830,000කින් කපාහරිමින් ද මධ්‍යස්ථාන 25 වසා දමමින්ද කර්මාන්තය මීට ප්‍රතිචාර දැක්වී ය. මීට අමතරව, ස්වාධීන නිෂ්පාදකයන් අතුගාදමමින් ද, තෙල් සැපයුම

හා මිල ගනන් පාලනය ඒකාධිකාරයන් අත සුරක්ෂිත කර ගනිමින් ද වෙලඳපොලේ තෙල් හා ගෑස් ප්‍රමානය පාලනය කිරීමට තරගකරුවන් කුමන්ත්‍රනය කලහ.

2005 දී, එක්සන් මොබිල්, බ්‍රිටිෂ් පෙට්රෝලියම්, රෝයල් ඩච්ෂෙල්, චෙවරොන් හා කොනොකො පිලිප්ස් යන ප්‍රමුඛතම තෙල් සමාගම් පහ, සිය ලාභය ඩොලර් බිලියන 111 ඉක්මවා යනු අත්වින්දාහ. එක්සන් මොබිල් යන ලෝකයේ විශාලතම යෝධ තෙල් සමාගම, එයට පසුව වාසනාවන්තයන් 500 ලැයිස්තුවේ එන සමාගම් හතරේ ම ඓක්‍යයට වඩා වැඩි ලාභයක් ලෙස, එක්සත් ජනපද ව්‍යාපාර ඉතිහාසයේ ඉහල ම ප්‍රමානය වන ඩොලර් බිලියන 36.1 උපයා ගත්හ. තායිවානය, නෝර්වේ හා ආර්ජන්ටිනාවේ දල ජාතික නිෂ්පාදනයේ එකතුව ඉක්මවා ගිය ඩොලර් බිලියන් 339ක ආදායමක් එය සතු විය.

ඉහල යන ගෑස් මිල මගින් දසලක්ෂ සංඛ්‍යාත සාමාන්‍ය ජනතාව මිරිකී යද්දී, එක්සන් මොබිල්හි ඉහල ම විධායකයන් හා ආයෝජකයන්, වන්දි හා වැඩිවන කොටස් වටිනාකම් ලෙස මිලියන සියගනනක් ඩැහැගත්හ. දෙසැම්බරයේ දී විශ්‍රාම ලත් ලී ආර්. රේමන්ඩ්, සමාගමේ සිය අවසන් වසර තුල ඩොලර් මිලියන 400කට වැඩි මුදලක් මිටමොලවාගත්තේ ය. 1993 හා 2005 අතර, ටෙක්සාස්හි පදනම්ව ඇති සමාගම මෙහෙයවමින් ගතකල කාලය තුල රේමන්ඩ් හට, ඩොලර් මිලියන 686ක් නැත හොත්, සෑම දිනකට ම ඩොලර් 144,573 බැගින් ගෙවා ඇත. මෙම කාලය තුල, කුවේට් රටෙහි මෙන් දෙගුනයක පරිමාවකින් තෙල් නිෂ්පාදනය කිරීමේ හැකියාව එක්සන් මොබිල් සමාගමට ලබා දෙමින්, මොබිල් සමාගම ඩොලර් බිලියන 81 කට අත්පත් කර ගැනීම සංවිධානය කල රේමන්ඩ්, රැකියා 10,000 ද අතු ගා දැමීය.

රේමන්ඩ්ගේ අනුප්‍රාප්තික රෙක්ස් ටිලර්සන් පසු ගිය වසර තුල ඔහුගේ වැටුප ඩොලර් මිලියන 13ක් දක්වා සියයට 33න් වැඩිවනු අත්දුටුවේ ය. එක්සන් හි ඉහලම විධායකයන් පස්දෙනා 2005 වසරේදී වන්දි වසයෙන් මුලු එකතුව ඩොලර් මිලියන 130ක් ගෙදර ගෙන ගියහ. ඔවුහු සීමිත කොටස් ඩොලර් මිලියන 280කට වඩා හිමි කරගනිමින්, ඩොලර් මිලියන 113ක අගයක් ඇති මනාප කොටස් ලබා ගත්හ. පසු ගිය දෙවසර තුල තෙල් මිල දෙගුනයක් වූ තත්වය තුල, කර්මාන්තය පුරාම තෙල් ප්‍රධානීන් ඒ සමානවම පිදුම් ලබා ඇත.

මෙම සමාගම් හා පුද්ගලයන්, වර්තමාන අර්බුදය ගසා කෑම හා උග්‍ර කිරීම මගින් දැවැන්ත ධනයක් ගොඩගසාගෙන ඇත. මොවුනතුරින් කිසිවෙකුටත්, හුදෙක් වත්මන් ඉල්ලුම සපුරාලීමට පමනක් නොව වඩාත් අවශ්‍ය කෙරෙන ආරක්ෂිත හා දැරියහැකි විකල්ප බලශක්ති මූලාශ්‍රයක් සංවර්ධනය කිරීමෙහි ලා අවශ්‍ය විශාල සමාජ ව්‍යායාමයක නිරත වීමේ සුලු හෝ උවමනාවක් ඇත්තේ නැත.

පෙට්රෝලියම් මත වන වත්මන් රඳා පැවැත්ම, නොදැරියහැකිවාක් මෙන් ම මරනීය තර්ජනයක් ය යන්න අවිවාදිත ය. පරිමිත වන ලෝකයේ බොර තෙල් සංචිත, නිෂ්පාදනය පුලුල් කිරීමේ පියවර ගන්නා තාක් දුරට, වඩාත් ඉක්මනින් අතුරුදහන් වනු ඇත. ඒ සමග ම, -- බුෂ් පාලනාධිකාරයේ විදහාව මැඩීම තිබියදී ම -- පෘථිවිය වාසය නොකලහැකි තැනක් බවට පත් කිරීමට තර්ජනය කරන පෘථිවි ගෝලය උනුසුම් වීමේ ප්‍රධාන හේතුව වන්නේ ද මෙම පාෂානිභූත ඉන්ධන පිලිස්සීම යි.

තවද මෙම පරිමිත සම්පත ලුහුබැඳ යාම විනාශකාරී මිලිටරිවාදයේ නැගීමට ද තුඩු දෙයි. ලක්ෂ සංඛ්‍යාත ඉරාකීයයන්ගේද, 2,500කට වැඩි එක්සත් ජනපද හමුදාවල ද ජීවිත බිලි ගත්, එක්සත් ජනපදයේ සාපරාධී ඉරාක යුද්ධයේ ප්‍රධාන හේතුව වන්නේ ද මෙය යි. ඒ සමානව ම, ඉරානයට එරෙහි නව යුද්ධයක් සඳහා විවෘතව සූදානම් වීම මෙන්ම, ගෝලීය බලශක්ති සැපයුම් පාලනය සඳහා චීනය තරගකරුවකු බවට පත් කෙරෙන එහි ප්‍රසාරනය වන ආර්ථිකය නිසා චීනය සමග මිලිටරි ගැටුමක් සඳහා සැලසුම් කිරීමේ ද ගාමකය වන්නේ එයයි.

## තෙල් සල්ලිවලින් මිලට ගතහැකි හොඳම ආන්ඩු

ඉහල යන ගෑස් මිල, සමහර කරුනුවල දී තෙල් සමාගම් මත "අනපේක්ෂිත ලාභ වාසනාවේ බදු" පැනවීමේ නීති සම්පාදනයට පවා යොමුවෙමින් ද, මිල මැන බැලීමේ පරීක්ෂන සඳහා ද, කැඳවුම් කිරීමට ඩිමොක්‍රටික් මෙන්ම රිපබ්ලිකානු දේශපාලඥයන් ද පොලඹවා තිබේ. තරයේ ම පොදු පරිභෝජනය සඳහා පමනක් වන මෙම රංගනයෙන් කිසිවක්ම සිදු නොවනු ඇත.

මහ තෙල් වෙලෙන්දන් වොෂින්ටනයේ දේශපාලන පක්ෂ දෙක ම මත දිගු කලක් තිස්සේ අති මහත් බලපෑමක් පවත්වා ගෙනවිත් ඇත. එහෙත් අද ඔවුන් සතුව ඇති දේශපාලනික පාලනයේ මට්ටම හමුවේ, 20 වන සියවසේ ආරම්භයේ දී ජෝන් ඩී. රොකෆෙලර්ගේ සහ ඔහුගේ ස්ටෑන්ඩඩ් ඔයිල් සමාගමේ යුගයේ දී තෙල් සමාගම් සතුව තිබූ ආනුභාවය අඟුටුමිටි තත්වයට වැටේ. ධවල මන්දිරය අරක්ගත්, ටෙක්සාස්හි හිටපු තෙල් වෙලෙන්දන් දෙදෙනා ද සමග, සෙනේට් හා කොන්ග්‍රස් සභිකයන් ඡන්දය ලබා ගත්තේ දෙපක්ෂය වෙතටම දේශපාලන ආධාර හා පෙලඹවීම් උත්සාහයන් ලෙස යොමු කල මිලියන සිය ගනනක ඩොලර්වලිනි. මහා තෙල් වෙලෙන්දන්ට බියවීමට දෙයක් නැත. ඩිමොක්‍රටික් හා රිපබ්ලිකන් පරිපාලනයන් ද්විත්වය ම තෙල් සමාගම් වෙත දැවැන්ත සහනාධාර හා බදු විරාමයන් සම්පාදනය කර තිබෙන අතර, පාරිසරික ආරක්ෂක රැකවරන ඉවත් කර ලෝක ගෝලය පුරා

ඇති සමාගම් සතු තෙල්බිම් හා නලමාර්ග ආරක්ෂා කිරීමට, මුලුමනින් ම පාහේ පෞද්ගලික හමුදාවක් ලෙස, එක්සත් ජනපද මිලිටරිය යොදවා තිබේ.

බුෂ් පරිපාලනයේ සමීපතමයෙකු වූ එක්සන් මොබිල්හි හිටපු ප්‍රධාන විධායක නිලධාරි රේමන්ඩ්, ආර්ක්ටික් කලාපයේ ජාතික වනජීවී රක්ෂිතයේ කැනීම් සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සැකසීමට සහාය වූයේ පෘථිවි ගෝලය උනුසුම් වීම පහත හෙළීමේ මොනම පියවරකට හෝ විරුද්ධ විය. 2001 දී සමාගම, උපජනාධිපති ඩික්චේනිගේ බලශක්ති කාර්යසාධක හමුදාවේ ප්‍රධාන සාමාජිකයෙකු වූ අතර, එය වෙනත් දේට අමතරව, එක්සත් ජාතීන්ගේ සම්බාධක ඉවත් කිරීමෙන් පසුව ඉරාක තෙල් බිම් පිලිබඳවත්, තවමත් අත ගසා නැති රටේ විශාල තෙල් සංචිත එක්සත් ජනපද හෝ බ්‍රිතාන්‍ය සමාගම් වෙතට නොව, රුසියානු, චීන හා ප්‍රන්ස තරගකරුවන් අතට පත් වීමේ අන්තරාය පිලිබඳවත් සාකච්ඡා පැවැත්වී ය.

පසු ගිය මාර්තුවේ දී, සෙනේට් අධිකරන කමිටුව, තෙල් සමාගම් විසින් මිල මැන බැලීම් කරනු ලැබී යයි සලකනු ලැබීම මත "පරීක්ෂා කිරීමේ" ප්‍රසිද්ධ සාක්ෂ්‍ය විභාගයක් පැවැත්වී ය. නැවතත් ඩිමොක්‍රටික් දේශපාලනඥයන්, "ව්‍යාපාර කෑදරකම" පිලිබඳව තමන් දන්නා බව අඟවමින් සාක්ෂ්‍ය දුන් තෙල් ප්‍රමුඛයන් වෙත සිය ඇඟිලි වැනී ය. එක්සන් මොබිල්හි නව ප්‍රධාන විධායක නිලධාරි රෙක්ස් ටිලරිසන්, සිය ප්‍රකාශයේ දී "පසු ගිය වසරේ අපගේ සාර්ථකත්වයෙන් මෙම කමිටුවේ පෙනී සිටින්නවුන් වාසි ලැබී යයි මම සැක කරමි" යනුවෙන් සෙනෙට් සභිකයන්ට සිහිපත් කරමින්, බෙලහීන ඉඟිකිරීම්වලට සමච්චල් කලේ ය. යාවජීව තෙල් ව්‍යාපාරිකයා ඔහු කිවූ දෙය මනාව දැන සිටියේ ය. කමිටුව තුල රැස්වූ ධනවත් සෙනෙට් සභිකයන් අතර සිටි ඇරිසෝනාහි රිපබ්ලිකානු ජෝන් කයිල්, එක්සන්හි විශාල කොටස් ප්‍රමානයක හිමිකරුවෙකු වන අතර දිගු කලක් කර්මාන්තයේ උවමනාකම් වෙනුවෙන් කැපවී සිටින්නෙකි.

## සමාජවාදී සමානතා පක්ෂයේ ක්‍රියා මාර්ගය

එක්සත් ජනපදයේ මිලියන සියගනනක් වැඩ කරන ජනතාවගේ ජීවන තත්වයන්, පිම්මේ ඉහල නගින ඉන්ධන මිල මගින් පිරිහෙලමින් ඇති තත්වය තුල, ඉන්ධන පිරිවැය පාලනයේ හදිසි පියවර ගත යුතුව ඇත.

ඒ සමග ම, පෘථිවි ගෝලය උනුසුම්වීම මගින් එල්ල කර ඇති වැඩෙන තර්ජනයට මුහුන දීම සඳහා, විකල්ප බලශක්ති මූලාශ්‍රයන් සංවර්ධනය කිරීමේ සුවිසල් කර්තව්‍ය ද, කල් දැමිය නොහැකි ය.

මහා තෙල් ව්‍යාපාරයේ ප්‍රතිපත්තීන් පිටුපස ඇති බලගතු සමාජ, මූල්‍යමය හා දේශපාලන අවශ්‍යතාවන්ට ද, ධනපති ලාභ පද්ධතියට ද, ඍජුවම පහරදීමෙන් පරිබාහිරව, පෙට්රෝලියම් මත පදනම්වූ දැරිය නොහැකි ආර්ථිකයට, දිගුකාලීන විකල්ප විසඳුමක් කෙසේ වෙතත්, ගෑස් මිල මුල් කර ගත් වත්මන් අර්බුදයට කෙටිකාලීන පිලිතුරක් හෝ සැපයිය නොහැක.

සමාජවාදී සමානතා පක්ෂය, ලාභ අවශ්‍යතාවන්ට ඉදිරියෙන් සමාජ අවශ්‍යතාවන් තැබීමේ ප්‍රතිපත්තියක් ඉදිරිපත් කරයි. අප, පෞද්ගලික පාරිභෝගිකයාගේ ද, සුලු හා මධ්‍යම පරිමාන ව්‍යාපාරිකයාගේ ද ගෑස් මිල වහාම ගැලුමක් ඩොලර් 1.50කට සීමා කල යුතු යයි කියා සිටිමු.

ව්‍යාපාරික ලාභ අවශ්‍යතාවන් හා පෞද්ගලික ධන සමුච්ඡය සඳහා මෙම අර්බුදය ගසාකෑම නතර කල යුතු ය. මහා තෙල් ව්‍යාපාරයේ වැඩ කටයුතුවල සමාජ විරෝධී හා සාපරාධී හැසිරීම වෙත වෛෂයිකව පිවිසිය යුතු ය. සියලුම ප්‍රමුඛ විධායකයන්ගේ පෞද්ගලික ගිනුම් විගනය ද ඇතුලත්, යෝධ තෙල් සමාගම්වල භාවිතය පිලිබඳව අපරාධ පරීක්ෂනයන් ආරම්භ කල යුතු ය. පසු ගිය වසර තුල තෙල් සමාගම් විසින් වාර්තා කල දැවැන්ත ලාභ මෙන්ම, කුපාඩි ලෙස විධායකයන්ට ගෙවූ ඩොලර් බහු මිලියන වන්දි පොදි, අත්පත්කරගෙන, පොදු පාලන අරමුදලකට බැර කල යුතු ය.

මෙම කෙටිකාලීන පියවරයන්, බලශක්ති කර්මාන්තයේ සංවිධානය හා මූල්‍ය ව්‍යුහය තුල කෙරෙන මූලික වෙනස්කම් සමග බද්ධ කල යුතු ය. ඇමරිකානු ජනතාව හා සැබවින්ම ලෝකයේ ම ජනතාව, පහල වැටෙන ජීවන තත්වයන් ගෙන් ද, පාරිසරික විනාශය හා යුද්ධය මගින් පෘථිවි ගෝලයට තර්ජනය කරන යෝධ බලශක්ති සංගතයන්ගේ ලාභ අවශ්‍යතාවන් සඳහා ද, ප්‍රාන ඇපයට ගෙන තිබේ. බලශක්ති සංගතයන් ජනසතු කිරීම මගින් මෙම ගලග්‍රහනය බිඳදැමීම අවශ්‍ය ය. එනම් එක්සන් මොබිල්, චෙව්රොන්, කොනොකො ෆිලිප්ස් යනාදිය පොදු අයිතියේ හා ප්‍රජාතන්ත්‍රවාදීව පාලනය කෙරෙන උපයුක්තතාවන් බවට හැරවිය යුතු ය.

විකල්ප බලශක්ති මූලාශ්‍රයන් සංවර්ධනය කිරීමේ ඩොලර් බහු ට්‍රිලියන ව්‍යායාමයටද, පරිසරයට හා මනුෂ්‍ය වර්ගයාගේ අනාගතයට ඇටවෙන අන්තරායට මුහුන පෑමට ද, ජාත්‍යන්තරව සම්බන්ධීකරනය කල ව්‍යාපාරය දියත් කිරීමට අවශ්‍ය මූල්‍ය සම්පත් මේ මගින් සැපයිය හැකි වනු ඇත.

ධනවත් පැලැන්තිය පෝෂනය කිරීම සඳහා හිතාමතාම වෙලඳපොල "හැසිරවීම" ට එරෙහිව, ගවේෂනය, සංවර්ධනය හා බලශක්ති සැපයුම් භාවිතා කිරීම, කම්කරු පන්තිය විසින් ප්‍රජාතන්ත්‍රීයව අනුමත කල, ප්‍රසිද්ධියේ වාදකරනු ලැබූ තර්කානුකූල ජාත්‍යන්තර සැලසුමක් මගින් මෙහෙයවිය යුතු ය. මෙම සැලැස්ම,

මිල අඩු, පාරිසරිකව ආරක්ෂාකාරී හා නවීකරනය කල හැකි බලශක්තියක් සඳහා ලෝක ජනතාවගේ අවශ්‍යතාවය සපුරාලිය යුතු ය.

දැවැන්ත ලාභ රැස් කර ගැනීමේ සිය උත්සාහයේ දී බලශක්ති ඒකාධිකාරයන් හා රථවාහන කර්මාන්තය, දිගු කලක් තිස්සේ විශ්වාසනීය පොදු ප්‍රවාහනයේ සංවර්ධනය වැලැක්වීමටත්, අතීතයේ පැවති ප්‍රවාහන පද්ධතීන් බිඳ දැමීමටත් කුමන්ත්‍රනය කර ඇත. බලශක්ති භාවිතය පිලිබඳ තර්කාන්විත සැලසුමක්, නාගරික පොදු ප්‍රවාහනයට හා සැහැල්ලු දුම්රිය පද්ධතීන් වෙතට ඩොලර් බිලියන ගනන් යොමු කිරීම මෙන්ම ඉන්ධන කාර්යක්ෂමතාවෙන් යුත් වාහන සංවර්ධනය කිරීම ද ඇතුලත් කර ගත යුතු ය.

මෙම අදහස්, මනෝරාජික නොවන අතර අනාගත මනුෂ්‍යවර්ගයා සඳහා පරම වසයෙන්ම අවශ්‍යවන්නේ ය. කෙසේද වුවත් වැඩ කරන ජනතාව සිය අයිතීන් එනම්, යහපත් ජීවන තත්වයන්, සුරක්ෂිත රැකියා, පිරිසිදු වටාපිටාවක් හා යුද්ධයෙන් නිදහස් අනාගතයක් යනාදිය, ඇමරිකාවේ පාලක පැලැන්තියේ දේපල අයිතියට හා ලාභ පිපාසාවට ඉහලින්, ප්‍රමුඛ ලෙස තහවුරු කිරීම අවශ්‍ය ය. මෙය අත් කර ගැනීම සඳහා කම්කරු පන්තිය, මහා ව්‍යාපාරිකයන්ගේ පක්ෂ දෙකේම ඒකාධිකාරය හා ඔවුන් ආරක්ෂා කරන, යල්පිනූ හා බංකොලොත් ධනේශ්වර පද්ධතිය අවසන් කිරීමටත් තමන්ගේ ම දේශපාලන උපකරනය එනම්, ජනතා සමාජවාදී පක්ෂයක් ගොඩනැගිය යුතු ය. 2006 මැතිවරනවලට තරග කරන අපගේ අපේක්ෂකයන්ගේත්, සමාජවාදී සමානතා පක්ෂයේත් ඉදිරි දර්ශනය මෙයයි.

© www.wsws.org